2021ජුනි මස 29

දෙමාපිය භාරකරුවන් වෙත,

අකිතකත නගරාධිපති ඉෂිමරු ෂින්ජි

## නව කොරෝනා එන්නත පිළිබඳ

අකිතකත නගරයේ, ආසාදනය පැතිරීමෙන් ඇතිවන බලපෑම් ප්‍රතිඵලදායී ලෙස මැඩපැවැත්වීම සඳහා, අවුරුදු 12 සිට 18 දක්වා වයස්වල පසුවන අය සහ ඔවුන්ගේ දෙමාපිය භාරකරුවන්ට ප්‍රමුඛතායිව එන්නත් ලබා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරන ලදී. (ඇමුණුම බලන්න)

කෙසේ වෙතත්, එන්නත් කිරීම ස්වකැමැත්ත මත පමණක් ම සිදු වන අතර එය අනිවාර්ය දෙයක් නොවේ. එන්නත් කිරීමෙන් එන්නත් කරන ස්ථානයේ වේදනාව, හිසරදය, ඇඟ සීතල වීම සහ උණ වැනි අතුරු ආබාධ ඇති විය හැකි අතර ඉතාමත්ම අඩු සම්භාවිතාවකින් සෞඛ්‍යයට හානි වීමේ අවදානමක් වුව ද ඇත. එන්නත් කර ගැනීමෙන් ආසාධනය වීම වැළැක්වීම මෙන්ම ආසාධනය වුවත් තත්ත්වය උග්‍රවීම වැළැක්වීම යනාදී හිතකර ප්‍රතිඵල ලැබෙන අතර ඇතිවිය හැකි අතුරු ආබාධවල අවදානම පිළිබඳව ද හොඳින් තේරුම් ගැනීමෙන් පසුව ඔබගේ තීරණය ගන්නා ලෙසත් ඉල්ලා සිටිමි.

※යම් ලෙසකින් නව කොරෝනා එන්නත එන්නත් කිරීමෙන් ඔබගේ සෞඛ්‍යට යම් ගැටළුවක් ඇතිවුවහොත් , ප්‍රතිශක්තිකරණ නීතිය යටතේ ඔබට සහනයක් ලබා ගත හැකිය.

අසාත්මිකතා සහ අතුරු ආබාධ පිළිබඳ විමසීම් සඳහා කරුණාකර පහත උපදේශන සේවා අමතන්න.


හිරොෂිම ප්‍රාන්තය නව කොරොන වයිරස් එන්නත් ඇමතුම් මධ්‍යස්ථානය

- ටෙලිෆෝන් ：082-513-2847（සතියේ දින/සෙන・ඉරිදා/නිවාඩු දින/පැය 24ම සේවා）
- ෆැක්ස් ：082-211-3006



විමසීම් :

සෞඛ්‍ය හා දීර්ඝායුෂ අංශය සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්ය මණ්ඩලය

ටෙලිෆෝන් : 0826-42-5633

ඔතසුකෙ ටෙලිෆෝන් : 42-5633

ෆැක්ස් : 0826-47-1282